
ගී සඳලුව
Gee... Sandaluwa
සිසිර දිසානායක

# සුවිපුල ගුණ මුහුදාණන්



මෙල්බන් නුවර පැවැත්වුණ ඉන්දියානු මියැසි සැඳෑවකට සහභාගි වෙන්න අප හට පසුගියදාක අවස්ථාව ලැබුණා. උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ගායනා, භජන් ගායනා හා හින්දි ගී ගයමින් සමාජ ශාලාවක එක් වූ මේ ඉන්දියානු පිරිස අතරට අපගේ මව්බිමේ උපන් ශිල්පිනියක ද එක් වුණේ ඔවුන්ගේ විශේෂ ආරාධනයෙනි. ඇයගේ සිතාර් වාදන හැකියාව දුටු ඉන්දීය තබ්ලා වාදන ශිල්පියෙකු ඇයට ආරාධනා කළේ තමන් තබ්ලා වාදනයෙන් දායක වන පොරොන්දුව මතයි. ඇය සංගීතාචාර්ය තිලකා කුලතුංග වාද්‍ය විශාරදවරිය යි.

මෙම ඉන්දියානු මියැසි හමුවේදී ඉන්දියානු වාදන හා ගායන ශිල්පීන් පවා මවිතයට පත් කරමින් "ජිළු" රාගය වාදනය කළ ඇය අනතුරුව ප්‍රකට සිංහල ගී කීපයක් එකට මුහු කරමින් කළ නිර්මාණයක් ද ඉදිරිපත් කළා. නිතර ඉදිරිපත් කරමින්, දරුවන් ලවා සංගීතාංග ශා ගායනාවන් ඉදිරිපත් කරමින් සවන් නෙත් පිනවන ඇය හා පිළිසඳරක යෙදෙන්නට අප ඇයට "ගී සඳළුව" ට ඇරයුම් කළා.

"මම දැන් මෙල්බන් පුරවරයට ඇවිල්ලා අවුරුදු දෙකක් පහුවුණා. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් තමයි අපි මෙහෙ ආවෙ. ඇත්තට ම එදා මෙදා තුර අපි සංගීතයෙන් කරපු කියපු දේ ගැන සතුටු වෙන්න පුළුවන්."

"මුලින්ම අපි 2012 දී අන්ධ පියෙක- වෙනුවෙන් ආධාර එකතු කරන්න සංවිධානය කරපු උත්සවයකටයි සම්බන්ධ වුණේ. අජිත්, ජගත් මාම්පිටිය කියන මහත්වරුයි ඒක සංවිධානය කළේ. අපේ පවුලම එකතුවෙලා නොමිළයේ තමයි අපේ දායකත්වය ලබා දුන්නේ."

තිලකාගේ පවුලේ සාමාජිකයින් සියළුදෙනාටම වාදන හැකියාවන් හා ගායන හැකියාවන් තිබීම මෙහිදී විශේෂයෙන් සඳහන් කරන්න වෙනවා.

ඊට පස්සේ දවසක් කොලින් පල්ලියගුරු මහත්මයයි, රෝහිත වැල්ලමිල්ලගේ මහත්මයයි මාව හොයාගෙන ඇවිල්ලා ආරාධනා කළා එයාලා එකතුවෙලා වාර්ෂිකව පවත්වන "සමාධි" භක්ති ගීත ගායනාවලට වාදනයෙන් සහයෝගය දෙන්න කියලා. අපේ ආගමයි සංගීතයයි දෙක එකිනෙකට සම්බන්ධයිනේ. ඒක තමයි සාමාජික සංස්කෘතිය වෙලා තියෙන්නේ. ඉතින් ඒක සාමාජික කටයුත්තක්, මෙහෙවරක් විදියට හිතලා මම ඒ ආරාධනාව පිළිගත්තා. "පන්සලෙන් වැඩක් පටන් ගන්න එක හොඳයිනේ....."

පසුගිය වසරේ භක්ති ගී ඉදිරිපත් කිරීම සඳහා තිලකා සිතාර් වාදනයෙන් සහය දැක්වූවා වාගේ ම මෙල්බන් නුවරින් නිර්මාණය වුණ භක්ති ගී තුනෙන් එකක් සඳහා තනුවත් සංගීතයත් නිර්මාණය කළා. ඒ මව්බිමේ සුනිල් සරත් පෙරේරා ප්‍රවීණ ගී පද නිබන්ධකයාණන්ගේ රචනාවකට.

"සුනිල් සරත් පෙරේරා මහත්මයා කියන්නේ පද රචකයින් අතර දැවැන්ත රචකයෙක්. ඒ අතිනුත් මම සතුටු වෙනවා ඒ වගේ වියත් පද රචකයකුගේ පද පෙළකට සංගීතය නිර්මාණය කරන්න ලැබුණ එක ගැන. රෝහිත වැල්ලමිල්ලගේ මහත්මයා යෝජනා කළ රාගයක් ඇසුරෙන් ම ඒ භක්ති ගීතය කළොත් හොඳයි කියල. "භෛරවී" කියන රාගයෙන් භක්තිය, කරුණාව කියන රස තමයි ගෙන දෙන්නෙ. ඉතින් මම අර යෝජනාව පිළි අරගෙන භෛරවී රාගය ඇසුරින් තනුවයි, සංගීතයයි නිර්මාණය කළා. සමාධි භක්ති ගීත ගායනා කණ්ඩායමට ගැලපෙන්න ඒ තනුව නිර්මාණය කරගන්න ලැබුණ එකටත්, ඔවුන්ට ඒක පහසුවෙන් පුහුණු කරවන්න ලැබුණ එකටත්, සාර්ථකව ඉදිරිපත් කරන්න ලැබුණ එකටත් මට හරි සතුටුයි.. ඇත්තට ම ඒ අය ඉක්මනින් මගේ තනුව ග්‍රහණය කරගන්න පුළුවන් දක්ෂ පිරිසක් වුණ එක ගැනත් සතුටුයි."

මෙවර "ගී සඳළුව සරසන සුනිල් සරත් පෙරේරා නිබන්ධකයාණන් ගේ "සුවිපුල ගුණ මුහුදාණන්" ගී පද රචනාවයි ඒ.

"අපේ අසල්වාසී ජපන් මිතුරියක් ඉන්නවා. ඇයගේ මාර්ගයෙන් මට අවසර ලැබුණා ජපන් සංගීත සන්ධ්වනියකට සිතාර් වාදනයෙන් එක් වෙන්න. අපේ මිතුරියගේ පියා අන්ධ පුද්ගලයෙක්. ඔහු කුතෝ :ණධඔධ* කියන සංගීත භාණ්ඩය වයන ශිල්පියෙක්. ඔහු ජපානයේ ඉඳන් කෙටි නිවාඩුවකට ආ වෙලාවේ තමයි මේ සංධ්වනිය පැවැත්වුණේ. ඔවුන්ගේ සිම්පනි එකක් තියෙනවා "ද ඕෂන් ඔෆ් ස්ප්‍රිං" :ඔයැ ධජ්ඔ දෆ්වරසබට* කියලා. අන්න ඒක තමයි ඔහුත් මාත් මෙහිදී වාදනය කළේ. ඇත්තටම ඒ වෙනුවෙන් පුහුණු වීමත්, ඉදිරිපත් කිරීමත් මට වෙනම ම අත්දැකීමක් වුණා. ඇත්තටම සිතාර් එකෙන් මට වාදනය කරන්න තිබුණ සංගීත ඛණ්ඩ මුල් සංධ්වනියේ වාදනය කරලා තිබණෙ බටනලාවෙන් එක ළඟ ඇඟිලි හසුරවමින් වාදනය කෙරෙන බටනලාව වෙනුවෙන් නිර්මාණය වුණ සංගීත ඛණ්ඩ ඉතා දිග පරාසයක ස්වර පුවරුව උඩ අත ඉහළ පහළ ගෙන යමින් සිතාර් එකෙන් වාදනය කිරීම ඇත්තට ම මට අභියෝගයක් වුණා. ජපන් සංගීතය ගැන වුණත් මම අහල තිබුණ දේට වඩා ප්‍රායෝගිකව ඒ ශිල්පයට එබී බලලා අත් විඳින්න ලැබුණ එක මගේ භාග්‍යයක් කියලා මම සළකනවා."

"අපේ සිංහල පිරිස අතර ගී ගයන්න කැමති පිරිස් එකතු වෙලා කොමියුනිටි සෙන්ටර්ස්වල ගී ගයන්න සංවිධානය වෙන එක දැං කීප පොළකම දකින්න ලැබෙනවා. ඒ අයටත් පසුබිම් සංගීතයෙන් මම උදව් දෙනවා. ඒ වගේම මගේ වාදනයත් ඒ තැන් වලදී ඉදිරිපත් කරනවා. ඒ දේවල් මම සතුටින් කරන්නේ අය කිරීමකින් තොරව. ඒ අය ලබන මානසික සතුට මටත් සතුටක්."

"සංගතයේ දෙකොටසක් තියෙනවා. මාර්ග සංගීතය කියන්නේ දෙවියන් අතර පවතින දෙයක්. දේශිය සංගීතය කියන්නේ මිනිසුන් අතර පවතින සංගීතය. ඉතින් ඒ දෙයින් ඒ රසිකයින් ව පිනවන්න ඉඩ ලැබුණ එක පිනක්. මට ළඟකදී මුණ ගැහුණා ඉන්දියානු කණ්ඩායම් කීපයක්.

ඇයගේ පුතා කුෂාන් දිමන්ත. මව්බිමේදී බටහිර සංගීතය මෙන් ම සිතාරය වැයීමට හපන්කම් පෙන්වූ තරුණියක්. ඔහු කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙනීම ලබනා කල එහි "සාගා" සංගීත කණ්ඩායමේ සිතාර් වාදකයා වුණා. කුෂාන් විභාග ඉලක්කකොටගෙන පියානෝ වාදනයද හදාරා තියෙනවා. මෙහි දී ඔහු ගිටාරය ඉගෙනීමට උනන්දු වන ලොකු කුඩා කා හටත් අත දෙන්නෙක්. ස්වර පුවරුවත් ඔහුට හුරුයි. දියණිය වෙනුරි ප්‍රමුදිතාත් පියානෝව හා සර පුවරුව හදාරා ඒ හැකියාව දියුණු කරගත් තරුණියක්. ඇය මව්බිමේදී ගායනයෙන් හා නර්තනයෙන් ද දස්කම් දක්වා ඇත්තියක්. තිලකාගේ සැමියා සුසිල් ද ගිටාරය, සරපුවරුව වාදනය කරමින් ඇයගේ කටයුතුවලට දරුවන් දෙදෙනා සමඟින් එක් වෙනවා. ඔහුත් ගායන හැකියාව ඇති අයෙක්. ඔහු පර්ත් නුවර සේවය කරනා බැවින් ඔහුගේ දායකත්වය ලැබෙන්නේ නිවාඩු ලද විටෙකයි. දරුවන් ද මේ වනවිට විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන්. අප විශාරද තිලකා කුලතුංගගේ මියැසි සිප් හැදෑරීම පිළිබඳව උනන්දු වූවා.

"මම සංගීත අධ්‍යාපනය කළේ මහනුවර එම්.ජී.පී. කලායතනයේ. සිරිල් පෙරේරා මහත්මයා තමයි මගේ ගුරුතුමා."

අප කවුරුත් දන්නා ප්‍රවීණ සංගීතවේදී ආචාර්ය වික්ටර් රත්නායකයන් ඇතුළු ප්‍රවීණ ශිල්පීන් ගණනාවකට සංගීත ශිල්පය ඉගැන්වූ කලායතනයයි ඒ. ඔවුන්ට ශිල්ප ඉගැන්වූ ගුරුවරයායි සිරිල් පෙරේරා මහත්මා. "සිහ ශක්ති" සංගීත කණ්ඩායමේ ආනන්ද පෙරේරා, අශෝක පෙරේරා සොයුරන් සිරිල් පෙරේරා මහත්මාගේ දරුවන්.

"මම මහනුවර ගුවන් විදුලියේ සංගී කටයුතුවලට සම්බන්ධ වුණා වාදනයෙන්. 1975 දී මම මයිලපිටිය මහා විද්‍යාලයේ සංගීතාචාර්යවරිය විදියට මුල්ම පත්වීම ලැබුවා. පාසැල හැර යනවාත් සමඟමයි, ඒ. වැඩි කාලයක් යන්න කලින් මට ගම්පොළ සහිරා විද්‍යාලයට මාරුවීමක් ලැබුණා. ඒ විද්‍යාලය විශාල පාසැලක් නිසා නොයෙක් විදියේ දක්ෂ ශිෂ්‍යයින්, සංගීත භාණ්ඩ එහෙම ලැබුණා. තූර්ය වාදක කණ්ඩායම භාර වුණොත් මට."

"වැඩිදුර පුහුණුවට මම ඊට පස්සේ ගිරාගම ගුරු විද්‍යාලයට ගියා. පසු කාලයක එහි ඉගැන්වීමේ කටයුතුත් කළා. හැටන් වල සෙන්ට් ගේබ්‍රියල් විද්‍යාලයටයි ඊට පස්සේ සේවයට ගියේ. උසස් පෙළට සංගීතය ඉගෙන ගන්න මගේ මුල්ම ශිෂ්‍යයා බිහිවුනේ ඒ විද්‍යාලයෙන්. පොල්ගොල්ල විද්‍යාපීඨයේ සංගීත කථිකාචාර්යවරිය විදියටත් මට උසස් වීමක් ලැබුණා. මෙහෙම ආපු ගුරු ජීවිතයෙන් මම විශ්‍රාම ලැබුවේ හොරණ ගෝනපල ප්‍රදේශයේ පළන්නොරුව විද්‍යාලයෙන්. ඒ මම විවාහයෙන් පස්සේ පදිංචි වුණ ප්‍රදේශය. සරත් දසනායක මහත්මයා තමයි මට එතෙන්ට එන්න උදව් කළේ. දුප්පත් ප්‍රදේශයක පාසැලක් වුණත් අපේ පෞද්ගලික වියදමින් ඇඳුම් පැළඳුම් එහෙම හදලා මම ඒ විද්‍යාලයේත් බටහිර තූර්ය වාදක කණ්ඩායමක් පටන් ගත්තා. අදටත් ඒ කණ්ඩායම පවතිනවා. ඒක මට ලොකු සතුටක්.

"ඇත්තට ම මගේ සැමියා පිට රට රැකියාවේ යෙදිලා හිටිය නිසා ලංකාවේදි බාහිර වැඩකටයුතුවලට සහභාගි වෙන්න බැරි වුණා. ඒ ළමයින්ගේ වැඩත් මට ම පැවරුණ නිසා. ඒ වුණත් අපි හිටිය ප්‍රදේශයට පාරක් ක්‍රමවත්ව හදාගන්න වැඩේට මූලික වුණා. ඒ ගැනත් සතුටුයි. මම කලින් විශ්‍රාම ගියෙත් දරුවන්ගේ කටයුතු නිසා."

"මෙහේ මම දැන් නිදහස් පුද්ගලයෙක් විදියට කටයුතු කරනවා. ඒ අතරේ මම හදාරපු ශිල්පය ලොකු කුඩා අයට බෙදා දෙන්න දැනට මම කාලය ගත කරනවා. පුතාවත් ඒ දේවල්වලට ගිටාරය වාදනයෙන් දායක කරගන්නවා.

කීප වතාවක්ම මට ප්‍රංශයට, බෲනායිවලට යන්න වුණා. සමහරවිට සැමියාත් එක්ක. ඉතින් අර සමහර උසස් තනතුරුවල මට වැඩ කරන්න ලැබුණේ අවුරුදු දෙකක් වාගෙ තකට් කාලවලයි. ගුරුසේවයේ දුරස්ථ අධ්‍යාපන සේවයේ කථිකාචාර්යවරියක් විදියටත් කටයුතු කළ බව මතක් වෙන්නෙ පස්සෙයි.

තිලකා මෙල්බර්න් නුවර අපගේ කලා කටයුතුවලට දායක වූ තවත් අවස්ථා ගණනාවක් අපහට දැකගන්න ලැබුණා. මොනෑෂ් සෞඛ්‍ය පදනමට ආධාර පිනිස කළ ප්‍රසංගයේදී කළ ශාස්ත්‍රීය වාදනය, මිහිඳු ළමා පදනම වෙනුවෙන් කළ ළමා ගීතය, තවත් ඉන්දියානු ප්‍රසංග කීපයක කළ සිතාර් වාදනය මේ අතරින් අමතක වෙන්නේ නෑ. දැනට කැනේඩියානු ජාතික සිතාර් වාදන ශිල්පියෙකු සමඟ වාදන ඉදිරිපත් කිරීමට පුහුණු වෙනවා.

මව් බිමේ තරුණසේවා සභාවේ යොවුන් සම්මාන උළලේ වසර දෙකක් ම සිතාර් වාදනය වෙනුවෙන් ප්‍රථම ස්ථානය දිනූ විශාරද තිලකා කුලතුංග සංගීතාචාර්යරියගේ සිප් ලබා විශ්ව විද්‍යාලයට ගිය සිසුන් පිරිස විශාලයි. ගුරු ජීවිතයෙන් ලද උපරිම සතුට එයයැ'යි ඇය අද සිතනවා. අපි ඇයට සුභ පතනවා !

සුවිපුල ගුණ මුහුදාණන් -
සුමියුරු වදන් සුරාණන්
සොමි ගුණ සඳ මඬලාණන් -
නමදිමු මහ මුනිදාණන්

රාගිනි මෝහය ඇවිලූ -
මරහුගෙ මායා සිඳලූ
මහමෙත් කුළුණු දයාලූ -
සිසිලෙන් තිලොව තෙමාලූ

අරහත් දහම් රදාණෝ -
සුගතය ගොයුම් පියානෝ
දුක් මුල දත් ඇජරානෝ -
මොක් සුව ලත් නිදුකානෝ

සුගතිඳු අමා ඔසුවන් දත් -
සසර ට නො වීය බියපත්
සුර බඹ ලෝචන කරනෙත් -
වපුලේ සත් හට පින් කෙත්

රචනය :සුනිල් සරත් පෙරේරා
සංගීතය : විශාරද තිලකා කුලතුංග
ගායනය : "සමාධි" බැති ගී කණ්ඩායම

## සෙවනැලි මිය යන හැන්දෑවේ

පසුගිය කළාපයේ "ගී සඳළුව" යටතේ සාකච්ඡාවට බඳුන් කළ මෛත්‍රී පනාගොඩගේ සෙවණැලි මිය යන හැන්දෑවේ ගීතයේ පද පෙළ මුද්‍රණ දෝෂයක් හේතුවෙන් පළ නොවූ බව කරුණාවෙන් සළකන්න එම පද පෙල මෙසේ මෙහි පළ කරමු සංසාකාරක - සන්නස




### සෙවනැලි මිය යන හැන්දෑවේ

පිල උඩ ඉඳගෙන
ඈත බලා ඉන්නේ
සී පද මුමුණන්නේ
ඒ හඬ ඇසෙනව දෝ ?
නෙත් යුග තෙත් වෙන්නේ
ඒ දුක දැනෙනව දෝ ?

වැලි බත් ඉවූ මිදුලේ
පළගැටියන් රජ වී
පුතු ගැන සිහිවෙනවා
මතකය බොඳ වෙනවා

මගෙ හිරු මියෙන වෙලේ
ඔබෙ හිරු ඉපදෙනවා
නෙතු පියවෙන්න කලින්
එනවද මගේ පුතුනේ ?

තනුව හා ගායනය :පණ්ඩිත් අමරදේව
සංගීත සංයෝජනය :ආචාර්ය රෝහණ වීරසිංහ
රචනය මෛත්‍රී පනාගොඩ